# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 අප්‍රේල් මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016.04.18 දින නිකුත් කරන ලදී)**

## විශ්වවිද්‍යාල (සංශෝධන)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

එල්.ඩී.—ඕ. 35/2013.

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 16 දරන පනතේ 75 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 75 වන වගන්තිය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

''ආචාර්යවරුන් හැර වෙනත් තැනැත්තන් විශ්‍රාම යෑම.

75. (1) ආණ්ඩුව විසින්, කලින් කල, තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම යෑමේ වයස, එය රජයේ නිලධරයෙකුට අදාළ වන දිනයේ සිටම බලාත්මක වන පරිදි ආචාර්යවරයකු හැර යම් ධුරයක් දරන්නකුගේ විශ්‍රාම යෑමේ වයස සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(2) (අ) කොමිෂන් සභාව විසින් හෝ එම ධුර දරන්නා අනුයුක්ත කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින් හෝ එම තැනැත්තා උසස් අධ්‍යාපන විද්‍යායතනයකට අනුයුක්ත කර ඇති අවස්ථාවක දී, එම විද්‍යායතනය අනුබද්ධ කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එකී උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින් එම විද්‍යායතනයේ නිර්දේශ මත අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ එම පාලන අධිකාරිය

2—PL 009856—425 (2016/03)

විසින් හෝ එම විද්‍යායතනය විසින් පවත්වනු ලැබීමට නියමිත පරීක්ෂණයකට යටත්ව එම ධුරය දරන්නාගේ විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ රාජකාරිය පැහැරහැරීම යන කරුණු සම්බන්ධයෙන් ඔහුගේ සේවය අත්හිටුවිය හැකි ය.

(ආ) එම පරීක්ෂණයෙන් පසු එම ධුරය දරන්නා වරදකරු බවට පත්වී ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ එම තැනැත්තා අනුයුක්ත කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින් හෝ එම තැනැත්තා උසස් අධ්‍යාපන විද්‍යායතනයකට අනුයුක්ත කර ඇති අවස්ථාවකදී, එම විද්‍යායතනය අනුබද්ධ කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එකී උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින්, කොමිෂන් සභාව හෝ අදාළ උසස් අධ්‍යාපන විද්‍යායතනයේ පාලන අධිකාරිය මගින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් මත එම ධුරය දරන්නා සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සිදුකල හැකි ය.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ ''පාලන අධිකාරිය'' යන අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපනය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

'' ''උසස් අධ්‍යාපන විද්‍යායතනය'' යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ හෝ 24ආ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලබන උසස් අධ්‍යාපන විද්‍යායතනයක් අදහස් වේ.''.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.